ස්ත්‍රී මධ්‍යස්ථානය
52/61, පීරිස් වත්ත, ඒකල,
ජා-ඇල, ශ්‍රී ලංකා

பெண்கள் மத்தியஸ்தானம்
52/61, பீரிஸ் தோட்டம், ஏக்கல,ஜா-எல,
இலங்கை

**Women's Centre**
**52/61, Peiris Watte,**
**Ekala,**

**Tel: 94 11 2231152/94 773416474** **ww.shelter@gmail.com** **www.womenscentresrilanka.org**

---

04.11.2025

කර්මාන්තශාලා කළමණාකාර මහතා,
ලංකා ගාමන්ට්ස් පුද්ගලික සමාගම,
නො. 14 A & 15A,
E.P.Z. කොග්ගල,
හබරාදුව.

ප්‍රිය මහත්මයාණෙනි,

**<u>අප සංවිධානයේ සාමාජිකයින් දෙදෙනෙකු වන ඔබ සමාගමේ සේවය කරමින් සිටින ලද ජී.එම්. නිලංකා සඳමාලි, ටී. සමන්ති යන අයට බලපෑම් කර සේවයෙන් ඉල්ලා අස්වන ලෙසට ලිපි ලබා ගැනීම.</u>**

ස්ත්‍රී මධ්‍යස්ථානය ශ්‍රී ලංකාවේ 1982 සිට, විශේෂයෙන්ම කම්කරු කාන්තාවන් වැඩ බිමේදී සහ සමාජයේදී මුහුණ දෙන විවිධ පීඩාකාරී හිංසනයන් සහ අසාධාරණයන් පිළිබඳව කටයුතු කරන සංවිධානයක් වේ.
අප සංවිධානය රාජ්‍ය නොවන සංවිධානයක් ලෙස රජයේ ලියාපදිංචි වී කටයුතු කරන අතර, මේ වන විට කටුනායක ඇතුලු නිදහස් වෙළඳ කලාප පිහිටි ප්‍රදේශ වලත්, නිදහස් වෙළඳ කලාප පිටත පිහිටි කර්මාන්තශාලා වලත් සේවය කරන කම්කරු කාන්තාවන්ගේ ඔවුන්ගේ අයිතිවාසිකම් පිළිබඳව සහ ඔවුන් මුහුණ දෙන අසාධාරණයන් සම්බන්ධයෙන් කටයුතු කල යුතු ආකාරය ගැන ඔවුන්ට අදාල ආරක්ෂන නීති පිලිබඳව සහ ඔවුන්ගේ වගකීම් පිළිබඳවද දැනුවත් කිරීම සඳහා වැඩමුලු සහ සම්මන්ත්‍රණ සංවිධාන කරමින් සිටියි.
ඒ අනුව අප මධ්‍යස්ථානය විසින් කොග්ගල නිදහස් වෙළද කලාප කම්කරු කාන්තාවන් වෙනුවෙන් ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතාවය, සංවේදීතාවය සහ ව්‍යාපාර මානව හිමිකම් සහ දුක්ගැනවිලි යාන්ත්‍රණය යන තේමාව යටතේ 2015.10.12 වන ඉරිදා එක්දින දැනුවත් කිරීමේ වැඩසටහනක් දලගල්ල ශාන්ති හෝටලයේදී සංවිධානය කර තිබුණි.
එම වැඩසටහනට සහභාගී වන ලෙස අප සංවිධානය සමඟ කටයුතු කරන නිදහස් වෙළඳ කලාප සේවිකාවන්ට ආරාධනා කර තිබූ අතර, ඔබ කර්මාන්තශාලාවේ සේවය කරන සේවිකාවන් කිහිප දෙනෙකුටත් එම වැඩමුලුවට සහභාගී වන ලෙස ආරාධනා කර තිබුණි.
එසේ තිබියදී අප වෙත වාර්තා කලේ 2025.10.11 වන දින සේවයේ යෙදී සිටින අතරතුර මානව හිමිකම් අංශයට කැඳවා ජී.එම්. නිලංකා සඳමාලි සහ ටී. සමන්ති යන දෙදෙනා හට, හෙට තමුසෙලා ෆැක්ට්‍රියේ යුනියන් එකක් හදන්න යනවා නේද කියා අසන ලදි. අපි එහෙම දෙයකට යන්නෙ නැහැ. හෙට නිවාඩු දිනය නිසා අපි කාන්තා වැඩසටහනකට යනවා ස්ත්‍රී මධ්‍යස්ථානය විසින් සංවිධානය කරන, යනුවෙන් පවසා ඇත.
මේ සහෝදරියන් දෙදෙනා විසින් පවසන කිසිම දෙයක් කළමණාකරු විසින් පිළි නොගෙන දිගින් දිගටම බරපතල ලෙස ඔවුන් වරදක් කරන ලෙස චෝදනා කරමින් පැය 2ක් පමණ රඳවා තබා ගනිමින් බලහත්කාරයෙන් අස්වීමේ ලිපි ලියවාගෙන ඇත. රු. 2000ක් දී මිනිහෙක් එක්ක හෝටල් කාමරයකට දාලා තියන්න ඕන මුං, යනුවෙන් අසභ්‍ය වචනෙන් බැන වදිමින්, මත්ද්‍රව්‍ය සම්බන්ධයෙන් වැරදිකාරියක් කර පොලීසියට රැගෙන යන බවට තර්ජනය කරමින් බලහත්කාරයෙන් අස්වීම් ලිපි ලියවාගෙන ඇත. එපමණක් නොව ඇයගේ බෑගය අවුස්සා ඒ තුල ඇති කොල

කැල්ලක 12 වෙනිදා වැඩසටහනට එන නම් සඳහන් කර ඇති සේවිකාවන්ද මානව සම්පත් අංශයට කැඳවා ඇත. ඔවුන් 7 දෙනාගෙන්ද මේ පිළිබඳව විමසා පසුවදා පැවැත්වෙන වැඩසටහනට යන බව පැවසූ විට ඒ පිළිබඳව විස්තරයක් ලියා දෙන ලෙස බල කර ඇත . ඔවුන් ඒ විස්තරය ලියූ පසු ඔවුන් නැවත සේවයට යවා ඇත.
ඉහත දැක්වෙන සිද්ධීන් වලට අනුව පැහැදිලිවම පෙනී යන්නේ ආයතනයේ කළමණාකාරිනියන් විසින්, අප සංවිධානය විසින් 2025.10.12 වන දින සංවිධානය කර තිබූ වැඩමුළුවට සහභාගී වීමට ආරාධනා ලැබීම වරදක් ලෙස සලකා, ඔවුන් වෘත්තිය සමිති හැදීමට කටයුතු කරනවා යන චෝදනා නගමින්, ඔවුන්ට බලපෑම් කර, රැකියාවෙන් ඉල්ලා අස්වෙන බවට ලිපි ලබා ගෙන මොවුන් දෙදෙනාගේ රැකියා අහිමි කර ඇති බවත්, තවද තමන්ගෙන් බලහත්කාරයෙන් ලබා ගත් ලිපි ඉල්ලා අස් කරගන්නා බවට පසු දිනම ඔබ ආයතනයට ලිපි මඟින් දැනුම් දී තිබියදීත්, මෙතෙක් එම සේවකයින් සේවයට කැඳවා නැත.
මෙහි ඉහත සඳහන් කල පරිදි අප සංවිධානය 2025.10.12 වන දින සංවිධානය කර තිබුනේ ඔවුන් කම්කරු කාන්තාවන් ලෙස සේවිකාවන්ට අදාල දැනුවත් කිරීමේ වැඩමුළුවක් වන අතර, එයට සහභාගී වීම ඔබ ආයතනය වෘත්තිය සමිතියක් සැදීමට උත්සාහයක් ලෙස හුවා දක්වමින් මේ සේවිකාවන්ට මෙලෙස දඬුවම් කිරීම පිළිබඳව අප සංවිධානයේ බලවත් විරෝධය මෙයින් පළ කරන්නෙමු.
තවද තමන් කැමති ඕනෑම වෘත්තිය සමිතියකට බැඳීම ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14 වෙනි වගන්තිය යටතේ සහතික කර ඇති, මූලික අයිතියක් වන බැවින් එසේ කිරීමට තැත් කරනුයේයැයි යන චෝදනාව මත එම සේවිකාවන්ගේ රැකියා අහිමි කිරීම ඔවුන්ගේ මූලික අයිතීන් උදුරා ගැනීමක්ද වේ.
එපමණක් නොව ඔබ සමාගම නිෂ්පාදනය කරනු ලබන ඔබ සමාගමේ ගැනුම්කරුවන්ගේ සන්නාම වලට අදාල, ආචාරධර්ම පද්ධතියේ කොන්දේසි අනුව එම භාණ්ඩ නිෂ්පාදන කරනු ලබන සේවිකාවන්ගේ මූලික අයිතීන් වලට ගරු කර ඒවා ක්‍රියාත්මක කිරීමට බාධා නොකිරීමට ඔබ සමාගම බැඳී සිටින බැවින් එවැනි අභූත චෝදනාවක් එම සේවිකාවන්ට නගමින්, එම සේවිකාවන්ගේ රැකියා අහිමි කිරීම එකී ආචාරධර්ම පද්ධතීන් උල්ලංඝණය කිරීමක්ද වේ.
ඔබ සමාගම කර ඇති මෙම ක්‍රියාවේ ඇති බැරෑරුම්කම පිළිබඳව ඔබගේ අවධානය යොමු කරන අතර, දැනටමත් ඔබ සමාගම කර ඇති නීත්‍යානුකූල නොවන බරපතල වරද නිවැරදි කිරීම සඳහා, එම සේවිකාවන් දෙදෙනා සේවයට කැඳවීමට කටයුතු කරන ලෙස කරුණාවෙන් ඉල්ලා සිටින්නෙමු.

මෙයට විශ්වාසී,



.......................................
පද්මිණී වීරසූරිය
විධායක අධ්‍යක්ෂිකා-ස්ත්‍රී මධ්‍යස්ථානය

පිටපත්,

- කම්කරු ඇමතිතුමා
- නියෝජ්‍ය කම්කරු ඇමතිතුමා
- කම්කරු කොමසාරිස්තුමා
- නියෝජ්‍ය කම්කරු කොමසාරිස්
- BOI අධ්‍යක්ෂක ජෙනරාල්
- ගාල්ල BOI අධ්‍යක්ෂකතුමා
- ගාල්ල කම්කරු කාර්යාලය
- මානව හිමිකම් කොමිසම
- මානව හිමිකම් සංවිධාන
- කාන්තා සංවිධාන
- වෘත්තිය සමිති